# සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
## கூட்டுறவு அபிவிருத்தித் திணைக்களம்
## DEPARTMENT OF COOPERATIVE DEVELOPMENT

දුරකථනය / தொலைபேசி / Telephon: 011-2478373, 011-2478374, 011-2478376

තැ.පෙ.419, අංක 330, යුනියන් පෙදෙස, කොළඹ 02
த.பெ.இ.419, இல. 330, யூனியன் ப்ளேஸ், கொழும்பு 02
P.O.Box 419, No. 330, Union Place, Colombo 02

ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2478386, 011-2478377

විද්‍යුත් තැපෑල / மின்அஞ்சல் / e-mail: info@coop.gov.lk, depcoopdev@gmail.com

වෙබ් අඩවිය / இணையத்தளம் / Web Site: www.coop.gov.lk


මගේ අංකය / எனது இல / My No: ස.සං.දෙ./බැංකු/2/4

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி / Date: 2023.04.06

**චක්‍රලේඛ - බැ/නි/ඒ/2023/01**

සියලුම මූල්‍ය සේවා සමුපකාර සමිති සහ
සංගම්වල ගරු සභාපතිවරුන් වෙත,

**විවිධ සේවා සමුපකාර සමිතිවලට සම්බන්ධිත ග්‍රාමීය බැංකු සහ වෙනත් මූල්‍ය සේවා සමිති / සංගම් විසින් ස්වර්ණාභරණ මත උකස් අත්තිකාරම් ප්‍රදානය කිරීමේදී මුහුණ දෙන අවදානම් කළමනාකරණය සඳහා "උකස් ගැනීම වෙනුවෙන් වූ අවිනිශ්චිතතා අරමුදලක්" ආරම්භ කර පවත්වාගෙන යාම පිළිබඳව සමිති / සංගම් විසින් කටයුතු කළ යුතු ආකාරය.**

01. හැඳින්වීම

මෙම චක්‍රලේඛයේ අරමුණ වන්නේ ස්වර්ණාභරණ උකස් ගැනීමේ ව්‍යාපාරයේ නිරත වන සමුපකාර මූල්‍ය සේවා සමිති / සංගම් විසින් මුහුණ දෙන ණය අවදානම, මෙහෙයුම් අවදානම සහ වෙළෙඳපොල අවදානම කළමනාකරණය කිරීම පිණිස එම මූල්‍ය සේවා සමිති / සංගම් වල උකස් අත්තිකාරම් තුළින් උපයන ආදායම් භාවිතා කරමින් මාසිකව විශේෂ වෙන්කිරීම් ගිණුමකට මාරු කරමින් ස්වාරක්ෂක අරමුදලක් ගොඩනැගීම වේ.

02. අරමුදලේ අරමුණ

1. සමුපකාර ග්‍රාමීය බැංකු, උකස් ව්‍යාපාරයේ නිරත වීම ආරම්භ වූයේ 1964 වර්ෂයේ වන අතර එවක පටන් ඉහත අවදානම් කළමනාකරණය සඳහා අවිනිශ්චිතතා අරමුදලක් එක් එක් සමුපකාර සමිතිය වෙනුවෙන් මහජන බැංකුවේ පවත්වාගෙන යනු ලැබී ය.

   එම අරමුදල සඳහා මාසිකව උකස් පොළී ආදායමෙන් සියයට එකක්(1%) වෙන් කරන ලදී. එසේ වෙන්කරන ලද මුදල් සමුපකාර ග්‍රාමීය බැංකුවල උකස් කටයුතු නිසා සිදුවන අලාභහානිවල දී හානි පූර්ණය සඳහා විශේෂ කමිටුවක නිර්දේශය මත අදාල සමිතියට මුදල් ලබා දෙන ලදී.

   සමුපකාර ග්‍රාමීය බැංකු මහජන බැංකුවේ උකස් නියෝජිතත්වයෙන් ඉවත් වී වෙනත් ආකාරයන්ට උකස් කටයුතු ඇරඹීමත් සමඟ ඇතැම් සමිතිවල හානි පූර්ණයන් සඳහා මෙම ක්‍රමවේදය අත්හිටුවීම නිසා උකස් කටයුතු වලින් සිදුවන මෙහෙයුම් අවදානම් අලාභ

සේවකයන්ගෙන් අයකිරීම වැනි ක්‍රමවේදයන් මඟින් සිදු කිරීමට කටයුතු කරන අතර, මෙය උකස් කටයුතුවල නිරත සේවකයින්ගේ අසහනයට මෙන්ම සමිතිවල මෙම කටයුතුවල අවදානම් ඉහල යාමට ද අහිතකර ලෙස බලපා ඇත.

2. වෙන්දේසිවල දී රත්‍රන්වල වෙළෙඳ මිල පහත වැටීම නිසා සිදුවන පාඩු මෙම අරමුදලින් පියවා ගත හැකි වීමෙන් සමිති/සංගම්වල පොදු ලාභයට සිදුවීමට ඉඩ ඇති හානිකර තත්ත්වයන් වලකා ගත හැකි වේ.
3. උකස් කටයුතු වල නිරත කාර්ය මණ්ඩලයේ අතපසුවීම් හෝ සිතා මතා සිදුකරන සාවද්‍ය පරිචයන් නිසා සිදුවන මූල්‍යමය අලාභයන් මෙම අරමුදලින් ආවරණය කරගත හැකි වීම.
4. රන් භාණ්ඩ සොරා ගැනීම නිසා සිදු වන අලාභ හානි ප්‍රතිපූරණය කර ගත හැකි වීම.
5. සේප්පු රක්ෂණයෙන් ආවරණය නොවන අලාභ හානි සඳහා ස්වාරක්ෂකයක් වීම.

03. අරමුදලේ ක්‍රියාන්විතය

1. එක් එක් මාසය අවසානයේ ලාභාලාභ ගිණුමට බැර කරන මාසික උකස් පොළී ආදායමෙන් සියයට පහක් (5%) මාසය අවසානයේ දී රාජ්‍ය බැංකුවක ඉතුරුම් ගිණුමකට මාරු කළ යුතු අතර, එම ගිණුමේ ශේෂය සමුච්චය වීම අනුව රාජ්‍ය බැංකුවක ස්ථාවර තැන්පත් ගිණුමකට මාරු කල යුතු ය. මෙම ගිණුමේ ශේෂය මත ණය ලබා ගැනීම හෝ වෙනත් එවැනි කාර්යයක් සඳහා භාවිතා නොකළ යුතු ය.
2. එම ස්ථාවර තැන්පතුව සඳහා වන පොළිය ද එම ගිණුමටම බැර කළ යුතු ය.
3. මේ සඳහා පහත දැක්වෙන අයුරින් ලෙජර් පිවිසුම් පැනවිය යුතු ය.

උකස් අවිනිශ්චිත අවස්ථා අරමුදල් වියදම් ගිණුම - හර
(මාසික උකස් පොළී ආදායමෙන් 5%ක්)
උකස් අවිනිශ්චිත අවස්ථා අරමුදල් ගිණුම - බැර

* (මෙම ගිණුම මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ වගකීම් ගිණුමක් ලෙස දැක්විය යුතු ය.)

4. එම ස්ථාවර තැන්පතුව සඳහා පවත්නා පොළී අනුපාතයට වඩා වැඩි පොළී අනුපාතයක් ලබා ගැනීමට බැංකුව සමඟ කතිකා කල යුතු ය.

04. අරමුදලේ භාවිතය

1. අරමුදල කිසිදු බාහිර කටයුත්තක් සඳහා යොදා නොගත යුතු අතර ඉහත 02 යටතේ සඳහන් හානිපූර්ණයන් සඳහා පමණක් භාවිතා කල හැකිය.
2. අරමුදල භාවිතා කිරීම සඳහා අදාළ හානිය සිදු වූ ග්‍රාමීය බැංකු හා මූල්‍ය සේවා සමිතියේ / සංගමයේ කළමනාකරු විසින් සමිතියේ / සංගමයේ බැංකු සේවා ප්‍රධානී හෝ වෙනත් අදාළ ජ්‍යෙෂ්ඨ නිළධාරියෙකු මාර්ගයෙන් එම හානිපූර්ණය සාධාරණීකරණය කරමින් සිද්ධියට අදාළව පොලිස් පැමිණිල්ලේ පිටපතක්, පොලිසියේ බී වාර්තාවේ පිටපතක්, සමුපකාර දෙපාර්තමේන්තුව විසින් සිදු කරන විශේෂ විමර්ශනයක හෝ

විශේෂ විගණනයක වාර්තා සහ වෙනත් පරීක්ෂණ වාර්තා අදාළ කමිටුවට එනම්, වත්කම් හා වගකීම් කළමනාකරණ කමිටුව (ALCO) හෝ වෙනත් විශේෂ කමිටුවකට ඉදිරිපත් කළ යුතු අතර එම කමිටුවේ නිර්දේශයන් අනුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වන්දි ගෙවීම පිළිබඳව තීරණය කළ යුතු ය. මෙම වන්දි විනිශ්චය කමිටුවට සමිතිය / සංගමය භාර දෙපාර්තමේන්තු නිළධාරියා අධීක්ෂකයෙකු වශයෙන් සහභාගී විය යුතු ය.

3. මෙම හානිවලට වගකිව යුතු සේවකයන් පිළිබඳව මූලික විමර්ශනයක් සිදු කර විනය තීරණයන් ගැනීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීමකි.
4. එම අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා සහ සියළුම පරීක්ෂණ වාර්තා ද්වන්ධ පාලනය යටතේ සුරක්ෂිතව තිබිය යුතු ය.

මෙම චක්‍රලේඛය ක්‍රියාත්මක කරමින් රන් භාණ්ඩ උකස්කරුවන්ගේ විශ්වාසය තහවුරු කර ගැනීම තුළින් සමිති / සංගම්වල උකස් ව්‍යාපාර කටයුතු ප්‍රවර්ධනය කිරීමටත්, පොදු ජනතාවට සාධාරණ පිරිවැයකට සිය හදිසි මූල්‍ය අවශ්‍යතා සපුරා ගැනීමට සහාය වන අයුරින් අවශ්‍ය කටයුතු කරන ලෙස අවධාරණය කරමි.

ඩී.ජීවනාදන්,
සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ
සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්

පිටපත්

| | |
|---|---|
| 1. අධ්‍යක්ෂක ජනරාල් ( ජාතික සමුපකාර සංවර්ධන ආයතනය ) | - කරු.දැ.පි |
| 2. දෙපාර්තමේන්තුවේ සියළුම මාණ්ඩලික නිලධාරීන් | - කරු.දැ.පි හා අ.ක.ස |
| 3. සමුපකාර සමිති අධීක්ෂණ නිලධාරීන් | - කරු.දැ.පි හා අධීක්ෂණ කටයුතුවල දී අවදානය යොමු කිරීම සඳහා |
| 4. විගණන නිලධාරීන් | - කරු.දැ.පි හා වාර්ෂික විගණනයේදි අවධානය යොමුකිරීම සඳහා |